PN/SD/2020-01
28.03.2020

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## බදු ගෙවන්නන් වෙත කෙරෙන නිවේදනයයි

**සමථයකට පත්කළ යුතු මුද්දර ගාස්තුව**

**2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන කාර්තුව සඳහා ගෙවීම සහ වාර්තාව**

මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අනුව 2020, මුද්දර ගාස්තු සමථයකට පත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරය ලබා ගෙන ඇති පහත සඳහන් තැනැත්තන් විසින් මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන කාර්තුව සඳහා වන මුද්දර ගාස්තු ගෙවීම සහ වාර්තාව භාර දීම 2020 අප්‍රේල් මස 15 දින හෝ එදිනට පෙර කළ යුතු වේ.

- රක්ෂණ ඔප්පු නිකුත් කරනු ලබන යම් තැනැත්තකු
- බලපත්‍ර නිකුත් කරන යම් අධිකාරියක්
- ණය කාඩ්පතක් පාවිච්චි කිරීමේදී යම් මුදල් ගෙවීමක් සඳහා හිමිකම් පාන, ඉල්ලා සිටින හෝ ඉල්ලුම් කරන ඉල්ලීමක් මත යම් සේවා සපයන්නකු
- සේවකයන් සඳහා කරන ලද ගෙවීම් සඳහා ලදුපත් භාරගනු ලබන පුද්ගලයින් සියයකට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති සේවා යෝජකයකු
- නියම කර ඇති ආකාරයට හෝ අවස්ථාවට අනුව යම් ප්‍රභේදයක් සාධන පත්‍ර ලෙස මුද්දර යෙදීම ප්‍රායෝගික නොවන හෝ කාර්යයක් වීම ලෙස සැලකිල්ලට ගැනීමේදී යම් වෙනත් ආකාරයේ සාධන පත්‍ර නිකුත් කරන වෙනත් තැනැත්තකු

දැනට රට තුළ පවතින තත්වය සලකා බැලීමෙන් පසු, එවැනි තැනැත්තන් සඳහා ඉහත කාල සීමාවට අදාළ ගෙවීම් කිරීමට සහ වාර්තාව භාර දීමට 2020 අප්‍රේල් 30 දින දක්වා ඉඩ දෙනු ලැබේ.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

බදු - වඩා හොඳ අනාගතයකට